# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1986 අංක 11 දරන මානසික සෞඛ්‍යය පිළිබඳ ජාතික සභාව – ‘සහනය’ (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1986 අප්‍රේල් මස 22 වන දින.]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1986 අප්‍රේල් මස 25 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 60 යි

තැපැල් ගාස්තුව : ශත 75 යි

## 1986 අංක 11 දරන මානසික සෞඛ්‍යය පිළිබඳ ජාතික සභාව —'සහනය' (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1986 අප්‍රේල් මස 22 වන දින]

එල්. ඩී.—ඕ. 38/84.

**මානසික සෞඛ්‍යය පිළිබඳ ජාතික සභාව—'සහනය' සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

පූර්විකාව.

"මානසික රෝගී ශුභසාධන ජාතික සභාව" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන ආයතනයක්, ඒ ආයතනයේ සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුකූලව ඒ සභාවට සම්බන්ධ සියලු පරමාර්ථ සහ කරුණු සාර්ථක ලෙස කරගෙන යාමේ සහ ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද:

ඒ සභාව පිහිටුවනු ලැබුවේ කවර පරමාර්ථ සහ කරුණු සඳහාද ඒ පරමාර්ථ සහ කරුණු මෙතෙක් කල් ඒ සභාව විසින් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටුකර ගෙන ගොස් ඇති අතර, ඒ සභාව සංස්ථාගත කිරීමට ඉල්ලා ඇති හෙයින් සහ ඒ ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන ප්‍රයෝජනය සඳහා වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

කෙටි නාමය.

**1.** මේ පනත 1986 අංක 11 දරන මානසික සෞඛ්‍යය පිළිබඳ ජාතික සභාව—'සහනය' (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

මානසික සෞඛ්‍යය පිළිබඳ ජාතික සභාව—'සහනය' සංස්ථාගත කිරීම.

**2.** (මෙහි මින් මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) මානසික රෝගී ශුභසාධන ජාතික සභාවේ දැනට සාමාජිකයන් වන තැනැත්තන් සංඛ්‍යාව සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් ඇතුළත් කර ගනු ලබන තැනැත්තන්, මේ පනත ආරම්භ වන දින සිට සහ ඉන් පසු (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "මානසික සෞඛ්‍යය පිළිබඳ ජාතික සභාව—'සහනය'" යන අභිධානය සහ නාමය යටතේ, අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් බවට පත් විය යුතු අතර, ඒ සංස්ථාව විසින් ද ඒ සංස්ථාවට විරුද්ධව ද ඒ නාමයෙන් සියලු අධිකරණවල නඩු පවරනු ලැබිය හැකි ය. තව ද පොදු මුද්‍රාවක් තබා ගැනීමට හා පාවිච්චි කිරීමට ද සංස්ථාවේ කැමැත්ත පරිදි එය වෙනස් කිරීමට හා අමුතු කිරීමට ද සම්පූර්ණ බලය හා අධිකාරය එයට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථය.

**3.** පහත දැක්වෙන ක්‍රමවලින්, එනම්,—

(අ) වෘත්තිය වශයෙන් සුදුසුකම් ලත් තැනැත්තන්ගේ මාර්ගෝපදේශකත්වය යටතේ දිවා කාලයේ රැකබලා ගැනීමේ මධ්‍යස්ථාන සහ නිවාස වැනි ආයතන පිහිටුවා පවත්වාගෙන යාමෙන් ;

(ආ) මානසික රෝගීන් පුනරුත්ථාපනය කිරීමේ ක්ෂේත්‍රයෙහි ලා විද්‍යාත්මක පර්යේෂණ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට ධෛර්යය දීමෙන්, ආධාර කිරීමෙන් සහ ඒවාට සහභාගි වීමෙන් ;

ඒ—076886—6,700 (86/05)

(ඇ) ළුහුණු තැනැත්තන් ජාතීන් අතර හුවමාරු කර ගැනීමට අනුග්‍රහය දැක්වීමෙන් ;

(ඈ) මානසික රෝග මර්දනය කිරීම සඳහා අවශ්‍ය අධ්‍යාපනය විශේෂයෙන්ම, මානසික රෝගීන් පුනරුත්ථාපනය කිරීමට මුල් තැන දෙන අන්දමේ අධ්‍යාපනයක් සඳහා සහ අනුගමනය කළ යුතු ක්‍රම සඳහා අනුග්‍රහය දැක්වීමෙන්, ඊට ධෛර්යය දීමෙන් සහ එවැනි ක්‍රියා මාර්ග සම්බන්ධයෙන් ඔවුන්ගේ උනන්දුව ඇති කිරීමෙන් සහ සහයෝගය ලබා ගැනීමෙන් ;

(ඉ) මානසික රෝගීන්ට ප්‍රතිකාර කිරීමේ කොටසක් වශයෙන් පිහිටුවන ලද පුනරුත්ථාපන වැඩ පිළිවෙලවල් විෂයෙහි ලා ආණ්ඩුවේ, දේශීය සහ ජාත්‍යන්තර සංවිධානවල සහ ශුභ පතන්නන්ගේ ආධාර හා උපකාර ලබා ගැනීමෙන් ;

(ඊ) සංස්ථාවේ අරමුණු හා පරමාර්ථවලට සමාන අරමුණු හා පරමාර්ථ ඇති යම් ව්‍යාපෘතියක දී හෝ ව්‍යවසායක දී ආණ්ඩුවට හෝ යම් පළාත් පාලන ආයතනයකට හෝ ශ්‍රී ලංකාවේ වුවද වෙනත් ස්ථානයක වුවද පිහිටි යම් අධිකාරියකට අනුග්‍රහය දැක්වීමෙන් ; හා

(උ) මානසික රෝගීන් අඛණ්ඩව රැක බලා ගැනීම සහ පුනරුත්ථාපනය කිරීම සඳහා රෝගීන්ට හෝ ඔවුන්ගෙන් යැපෙන්නන්ට පහසුකම් ලබා දීමෙන් සහ ආධාර කිරීමෙන්

මානසික රෝගවලට ගොදුරු වූ තැනැත්තන් සමාජමය වශයෙන් පුනරුත්ථාපනය කිරීම සඳහා ක්‍රම සහ උපක්‍රම සැලසීම සංස්ථාවේ පොදු පරමාර්ථය වේ.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, බැංකු ගිණුම් ආරම්භ කිරීමේ, පවත්වාගෙන යාමේ සහ වසා දැමීමේ ද ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ සහ ලබා ගැනීමේ ද ආධාර සහ ප්‍රදානයන් භාර ගැනීමේ හෝ එකතු කිරීමේ ද සංස්ථාවේ මුදල් ආයෝජනය කිරීමේ ද සංස්ථාවේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය සේවයට බඳවා ගැනීමේ, සේවයේ යෙදවීමේ හා සේවයෙන් පහ කිරීමේ ද බලය ඇතුළුව, සංස්ථාවේ පරමාර්ථ සියල්ලම හෝ ඉන් යම් පරමාර්ථයක් හෝ ඉටු කර ගැනීම සහ වැඩිදියුණු කර ගැනීම සඳහා අවශ්‍ය වන නැතහොත් යෝග්‍ය වන සියලු ක්‍රියා, කරුණු සහ දේවල් කිරීමට, ඉටු කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට සංස්ථාවට බලය ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු පරිපාලනය කිරීම.

5. (1) සංස්ථාවේ රීතිවලින් විධිවිධාන සලස්වා ඇති පරිදි සහ ඒ රීතිවලට අනුව තෝරා පත්කර ගනු ලබන තැනැත්තන්ගෙන් සමන්විත වූ පාලක කමිටුවක් විසින්, සංස්ථාවේ රීතිවලට යටත් ව, සංස්ථාවේ කටයුතු පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත ආරම්භ වන අවස්ථාවේ දී නිලය දරන සභාවේ පාලක කමිටුව සංස්ථාවේ ප්‍රථම පාලක කමිටුව විය යුතු ය.

**6.** (1) පාලක කමිටුව විසින් පත් කරනු ලැබිය යුතු භාරකාර මණ්ඩලයක් සංස්ථාවට තිබිය යුතු අතර, ඒ භාරකාර මණ්ඩලය විසින් සංස්ථාවේ රීතිවලට අනුකූලව ස්වකීය කාර්ය සහ කර්තව්‍ය ඉටු කළ යුතුය. සෑම භාරකරුවකු විසින්, තමාගේ මරණය තෙක් හෝ තමා ඉල්ලා අස්වන තෙක් හෝ සංස්ථාවේ යෝජනා සම්මත යක් මගින් ධුරයෙන් පහ කරනු ලබන තෙක් ධුරය දැරිය යුතු ය. භාරකාර මණ්ඩලය.

(2) භාරකරුවකු මිය ගිය විටක, ධුරයෙන් ඉල්ලා අස් වූ විටක හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබූ විටක ඔහු වෙනුවට අනුප්‍රාප්තික යකු පාලක කමිටුව විසින් පත් කරනු ලැබිය යුතුය.

(3) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන අවස්ථාවේ දී ධුරය දැරූ සභාවේ භාරකාර මණ්ඩලය, සංස්ථාවේ ප්‍රථම භාරකාර මණ්ඩලය විය යුතුය.

**7.** (1) යම් මහා සභා රැස්වීමක දී, ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, පසත දැක්වෙන කරුණු සියල්ලම හෝ ඉන් කිසිවක් හෝ සඳහා, මේ පනතේ විධිවිධානවලට අනනුකූල නොවන රීති කලින් කල සභාව විසින් සාදනු ලැබීම නීත්‍යනුකූල වන්නේය:— සංස්ථාවේ රීති.

(අ) සාමාජිකයන් වර්ග කිරීම හා සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් සාමාජිකත්ව යෙන් නෙරපීම;

(ආ) පාලක කමිටුවේ සාමාජිකයන් සහ නිලධරයන් තෝරා ගැනීම, පාලක කමිටුවේ සාමාජිකයන් හෝ නිලධරයන් තනතුරින් ඉල්ලා අස්වීම, තනතුර හිස් කිරීම, තනතුරින් ඉවත් කිරීම සහ ඔවුන්ගේ බලතල, ක්‍රියා කලාපය සහ කාර්ය;

(ඇ) භාරකාර මණ්ඩලයේ සාමාජිකයන් පත් කිරීම සහ ඔවුන් ගේ බලතල, ක්‍රියා කලාපය සහ කාර්ය;

(ඈ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, නියෝජිතයන්ගේ සහ සේවකයන්ගේ බලතල, ක්‍රියා කලාපය, කාර්ය සහ කර්තව්‍ය;

(ඉ) පාලක කමිටුවේ සහ භාරකාර මණ්ඩලයේ රැස්වීම් සම්බන්ධ යෙන් අනුගමනය කරනු ලැබිය යුතු කාර්ය පරිපාටිය, ඒ රැස්වීම් කැඳවිය යුතු සහ පැවැත්විය යුතු ආකාරය, ඒ රැස්වීම් පැවැත්විය යුතු වේලාවල් සහ ස්ථාන, ඒ රැස්වීම් පිළිබඳ දැන්වීම් සහ ඒ රැස්වීම්වල න්‍යාය පත්‍ර, ඒ රැස්වීම් වල ගණපූරණය සහ ඒ රැස්වීම්වල දී කරනු ලැබිය යුතු කටයුතු;

(ඊ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම, සංස්ථාවේ අරමුදල්වල භාරකාරත්වය සහ සංස්ථාවේ ගිණුම් පවත්වාගෙන යාම සහ විගණනය කිරීම;

(උ) බැංකු ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම; සහ

(ඌ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ සංස්ථාවේ පරමාර්ථ ඉෂ්ට කර ගැනීම.

(2) (1) වන උපවගන්තිය යටතේ රීති සාදනු ලැබූ ආකාරයේම වූ රැස්වීමක දී ඒ ආකාරයෙන්ම, සංස්ථාවේ යම් රීතියක් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ එය පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකිය. එසේ වුවද, එවැනි සංශෝධනයකට, වෙනස් කිරීමකට, එකතු කිරීමකට හෝ පරිච්ඡින්න කිරීමකට පාලක කමිටුවේ පූර්ව අනුමැතිය ලැබී තිබිය යුතු ය.

(3) සංස්ථාවේ සාමාජිකයෝ සංස්ථාවේ රීතිවලට යටත් විය යුත්තාහ.

සභාව විසින් ගෙවිය යුතු සහ සභාව වෙත ගෙවනු ලැබිය යුතු ණය.

**8.** මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන අවස්ථාවේදී පැවති සභාවේ සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර, සභාවට අයවිය යුතු සියලු ණය සහ එය වෙත ගෙවිය යුතු දායක මුදල් හා සම්මාදම්, මේ පනතේ කාර්ය සඳහා, සංස්ථාව වෙත ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපළ දැරිය හැකි බව.

**9.** යම් මිළට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, අන්තිම කැමති පත්‍රයකින් දේපළ නියාදනය කිරීමක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් හෝ සභාව සතු වන්නා වූ චංචල හෝ නිශ්චල යම් දේපළක් භාර ගැනීමට හා දැරීමට සංස්ථාවට නීතියෙන් බලය ඇති අතර, ඒ දේපළ විකිණීමට, උකස් කිරීමට, බදු දීමට, හුවමාරු කිරීමට හෝ අන්‍යාකාරයකින් නියාදනය කිරීමට සම්පූර්ණ බලය සහිතව, සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව, මේ පනතේ කාර්ය සඳහා සභාව විසින් ඒ සියලු දේපළ දැරිය යුතු ය.

සභාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.

**10.** භාරකාර මණ්ඩලයේ සාමාජිකයන් තිදෙනකු ඉදිරිපිට දී හැර සභාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, ඔවුන් පැමිණ සිටි බවට සංකේතයක් වශයෙන් ඔවුන් ඒ සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතුය. එවැනි අත්සන් කිරීමක් සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලබන අත්සනට පරිබාහිරව, කරනු ලැබිය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**11.** මේ පනතේ සඳහන් තැනැත්තන් සහ ඔවුන් මගින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන තැනැත්තන් හැර, ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් අගතියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.